# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2161/2 - 2020 පෙබරවාරි මස 03 වැනි සඳුදා - 2020.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* කේඩීඑස්/එච්ආර්/4/2/1/41.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/9/2014/ඩබ්එස්/16.

මහනුවර හා තදාසන්න ජල සම්පාදන ව්‍යාපෘතියේ මැදවල නව සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය සඳහා අතිරේක ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ, මැදවල ගමේ පිහිටි, මහනුවර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් මැන පිළියෙල කරන ලද අංක 6958 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 01 හා 02 ලෙස දැක්වෙන හෙක්ටයාර් 0.0075 ක් පමණ වූ ඉඩම් කැබලි 02:

01. කැබලි අංක 01 හා 02
ඉඩමේ නම: ගල්පඬිගාව වත්ත; හිමිකම් කියන අය: ඒ. බී. ජී. නෙවිල් ප්‍රියන්ත, බුළුකුඹුර, අංක 212, අංගොඩ, මැදවල; ප්‍රමාණය: හෙක්. 0.0075.

ඉහත සඳහන් ඉඩම් වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2020 අප්‍රේල් මස 01 වැනි දින පූ.භා. 10.00ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2020 අප්‍රේල් මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

මොහාන් ධර්මදාස,
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව.

2020 ජනවාරි මස 30 වැනි දින,
නුගවෙල, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 344

1A - G 31928 -27 (2020/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

*යොමු අංකය :* බීඩී/බීඩී/එල්එන්ඩී/3/5/18.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව අංක 1993/19 හා 2016.11.17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ 4ඒ පිටුවෙහි සඳහන් මූලික පිඹුරු අංක බ 685 ට අදාළ කැබලි අංක 34 නැවත මිනුම් කටයුතු සිදුකළ අතර, එම මැනුම් සංශෝධන පරිදි මූලික පිඹුරු අංක බ 735 හි කැබලි අංක 1 හා 2 ලෙස විභජනය වී ඇති අතර ඒ අනුව බ 685 හි අංක 34 ට අදාළ ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

කැබලි අංක 34 විභජනය :

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: නිකවත්ත; ඉඩමේ විස්තරය: වත්ත; අවුරුදු 5 ක් 10 ක් පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: රත්නායක මුදියන්සේලාගේ යසවතී රත්නායක, අංක 319ඒ, පස්සර පාර, බදුල්ල; ප්‍රමාණය: හෙක්ටයාර 0.0083.

02. **කැබලි අංක 2**

ඉඩමේ නම: නිකවත්ත; ඉඩමේ විස්තරය: වත්ත; අවුරුදු 2 ක් 3 ක් පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: රත්නායක මුදියන්සේලාගේ චන්ද්‍රානී, අංක 319බී, පස්සර පාර, බදුල්ල; ප්‍රමාණය: හෙක්ටයාර 0.0028.

ඩී.එම්.එල්.එච්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2020 ජනවාරි මස 22 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 345

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.